ආනන්ද විද්‍යාලය - කොළඹ 10 | 33 | S | I |

පළමුවන වාර පරීක්ෂණය - 2015 නොවැම්බර්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2016 අගෝස්තු

ගිණුම්කරණය - I
Accounts - I

13 ශ්‍රේණිය

පැය 02 යි
Two hours

* උපදෙස් :
* අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. පහත සඳහන් ප්‍රකාශන අතුරින් මූල්‍ය ගිණුම්කරණයේ කාර්යභාරය වඩාත් හොඳින් විස්තර කරනුයේ,
(1) ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සම්පාදනය කිරීම.
(2) කළමනාකරුවන්ට සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා පාලනය යන කාර්යයන් ඉටු කිරීමේදී කළමනාකරුවන්ට තීරණ ගැනීමට තොරතුරු සැපයීම.
(3) කාලච්ඡේදයක මූල්‍ය තත්වය, කාර්යසාධනය, මුදල් ප්‍රවාහය පිළිබඳ තොරතුරු සැපයීම.
(4) විභව ආයෝජකයින්ට වාර්තා කරන ඒකකයට සම්පත් සැපයීම සම්බන්ධයෙන් තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම.
(5) සියලුම ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම. (......)

02. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පීය රාමුව අනුව ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල තිබිය යුතු මූලික ගුණාත්මක ලක්ෂණයක් වන අදාළ බව සම්පූර්ණ වීමට,
(1) එම තොරතුරු සම්පූර්ණ, අපක්ෂපාතී හා කාලීන විය යුතුයි.
(2) එම තොරතුරු අවබෝධ කරගත හැකි, සංසන්දනාත්මක හා විශ්වසනීය නිරූපණයක් තිබිය යුතුයි.
(3) එම තොරතුරු ප්‍රමාණාත්මක, පුරෝකථනය කිරීමේ හා ප්‍රතිපෝෂණ හැකියාවක් තිබිය යුතුයි.
(4) එම තොරතුරු, නිවැරදි, සම්පූර්ණ හා සරල විය යුතුයි.
(5) එම තොරතුරු කාලානුරූපී, සත්‍යාපනය කළ හැකි හා වැරදිවලින් තොර විය යුතුයි. (......)

03. යම් ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකමට බලපෑමක් ඇති නොකරන්නේ පහත සඳහන් ගනුදෙනු අතුරෙන් කුමන ගනුදෙනුවද?
(1) අයිතිකරු විසින් මුදල් ආයෝජනය කිරීම.
(2) අයිතිකරු විසින් මුදල් ආපසු ගැනීම.
(3) විකුණුම් සඳහා මුදල් ලැබීම.
(4) වියදම් සඳහා මුදල් ගෙවීම.
(5) ව්‍යාපාරයේ වියදමක් අයිතිකරුගේ මුදලින් ගෙවා දැමීම. (......)

04. 2014.03.31 දිනට සුනිල්ගේ ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. මෙම ව්‍යාපාරය පාලන ගිණුම් පවත්වා නොගනී. වෙනසට හේතු වන්නේ,
1. විකුණුම් පොත රු. 160 000 කින් වැඩියෙන් එකතු කර තිබුණි.
2. ගැනුම් ගිණුම රු. 78 000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.
3. නෝවර්ගෙන් ලැබුණු රු. 138 000 ක චෙක්පතක් නිවැරදිව බැංකු ගිණුමේ සටහන් කර තිබූ නමුත් නෝවර්ගේ ගිණුමේ සටහන් කිරීමක් සිදු නොකිරිණි.

වැරදි නිවැරදි කිරීමට පෙර, අවිනිශ්චිත ගිණුමේ තිබූ ශේෂය වන්නේ,
(1) රු. 100 000 ක හර ශේෂයකි.
(2) රු. 220 000 ක බැර ශේෂයකි.
(3) රු. 100 000 ක බැර ශේෂයකි.
(4) රු. 220 000 ක හර ශේෂයකි.
(5) ඉහත කිසිවක් නොවේ.

ADVANCED LEVEL SCIENCEPAPERS SRI LANKA BLOGSPOT

05. චතුරිගේ ව්‍යාපාරයේ 2014 ජනවාරි මාසයේ, ණයට විකුණුම් පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

2014.01.01 දිනට ණයගැති ශේෂය	රු. 36000
මාසය තුළ ණයගැතියන්ගෙන් මුදල් ලැබීම්	රු. 58000
ආපසු එවූ භාණ්ඩ තොගය	රු. 4000
කපා හළ බොල්ණය	රු. 1000
ණයගැතියන්ගෙන් වට්ටම් අඩු කළා	රු. 2000
2014.01.31 දිනට ණයගැති ශේෂය	රු. 6000

මාසයේ මුළු විකුණුම් වටිනාකම වන්නේ,

(1) රු. 35000 (2) රු. 33000 (3) රු. 23000
(4) රු. 31000 (5) රු. 32000 (..........)

06. බොල්ණය ලෙස ණයගැතියන්ගෙන් රු. 25000 ක් කපා හැරීම සහ ලැබිය යුතු ආදායම් රු. 50000 ක් ආදායම් ප්‍රකාශනයේ දළ ලාභයට එකතු කර දක්වා තිබීම අදාළ වන ගිණුම්කරණ සංකල්ප පිළිවෙලින් වන්නේ,

(1) ඒකක හා උපචිත සංකල්පයයි.
(2) ගැලපුම් හා උපලබ්ධි සංකල්පයයි.
(3) අඛණ්ඩ පැවැත්ම හා උපචිත සංකල්පයයි.
(4) කාලච්ඡේද හා අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
(5) ගැලපුම් හා කාලච්ඡේද සංකල්පයයි. (..........)

07. සුළු මුදල් භාරකරුට ප්‍රධාන මුදල් භාරකරු රු. 650 ක් ලබා දී අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදී. මාසය තුළ ලිපිද්‍රව්‍ය සඳහා රු. 434 ක් ද ගමන් වියදම් රු. 376 ක් ද, සංග්‍රහ වියදම් රු. 850 ක් ද ගෙවිය. මාසය අවසානයේ ඔහු සතු අතැති මුදල රු. 590 කි. සුළු මුදල් අග්‍රිමය කොපමණද?

(1) රු. 2310 (2) රු. 2650 (3) රු. 2750
(4) රු. 2350 (5) රු. 2250 (..........)

08. 2015.03.31 දිනට සමාගමක පැවති තොගය ගංවතුර හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශ විය. 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

	රු. 000'
2014.04.01 දිනට තොගය	2000
ගැනුම්	3500
ආපසු ගැනුම්	500
විකුණුම්	4800
විකුණුම් වියදම්	600

පිරිවැය මත 20% ක ලාභ අනුපාතයක් පවත්වා ගනිමින් භාණ්ඩ විකිණීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.
2015.03.31 දිනට විනාශ වූ තොගයේ අගය කොපමණද?

(1) රු. 1000 කි. (2) රු. 500 කි. (3) රු. 1160 කි.
(4) රු. 1500 කි. (5) රු. 4200 කි. (..........)

09. පහත තොරතුරු 2014 ඔක්තෝම්බර් මාසය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයකට අදාළ වේ.

	රු. 000'
පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය	400
සෘජු ශ්‍රමය	200
සෘජු වෙනත්	100
නොනිමි තොග වැඩිවීම (නිෂ්පාදන පිරිවැයට අගය කරන ලද)	50
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	150

2014.10.01 දින ව්‍යාපාරයේ නිමි තොග නොතිබූ අතර ඔක්තෝම්බර් මාසයේ නිපදවූ භාණ්ඩවලින් 80% ක් එම මාසයේදීම විකුණා ඇත.

ADVANCEDLEVELPAPERS SRI LANKA

2014 සැප්තැම්බර් මාසය සඳහා ව්‍යාපාරයේ නිෂ්පාදන පිරිවැය හා විකුණුම් පිරිවැය කොපමණද?

	නිෂ්පාදන පිරිවැය (රු. 000)	විකුණුම් පිරිවැය (රු. 000)
(1)	800	640
(2)	800	800
(3)	900	720
(4)	900	800
(5)	900	900

(..........)

10. සීමිත ලක්මිණි පොදු සමාගමේ 2015.01.01 දිනට පහත ශේෂයන් දක්නට ලැබුණි.

	රු. 000'
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්	5000
පොදු සංචිතය	2000
රඳවාගත් ඉපැයුම්	500

2015.01.31 දින සමාගම විසින් එදිනට පැවති සෑම සාමාන්‍ය කොටස් පහකටම එක බැගින් වන සේ රු. 20 ක ප්‍රතිශ්‍රාවකට පොදු සංචිතය උපයෝගී කරගෙන සංචිත ප්‍රාග්ධනික කරන ලදී. මෙම ගනුදෙනුවේ බලපෑම නිවැරදිව දක්වා ඇත්තේ,

	ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස්	පොදු සංචිතය	මුළු හිමිකම
(1)	වැඩිවේ	අඩුවේ	වැඩිවේ.
(2)	වැඩිවේ	අඩුවේ	වෙනස් නොවේ
(3)	අඩුවේ	වැඩිවේ	අඩුවේ
(4)	අඩුවේ	අඩුවේ	වෙනස් නොවේ
(5)	වෙනස් නොවේ	අඩුවේ	වැඩිවේ

(..........)

11. සීමිත සමාගමක මූල්‍ය ප්‍රකාශනයක් තුළින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

දළ ලාභය	රු. 800 000 කි.
අනෙකුත් වියදම්	රු. 300 000 කි.
බදු පෙර ලාභය	රු. 500 000 කි.

වර්ෂයේ තක්සේරු ආදායම් බද්ද රු. 160000 කි. ශේෂ පිරික්සුමේ පහත විස්තර සපයා ඇත.

බදු වෙන් කිරීම (පසුගිය වර්ෂය සඳහා)	30000 (බැර)
බදු ගෙවීම් හර	140000

ගෙවූ බදුවලින් රු. 35000 ක් පසුගිය වර්ෂයට අදාල වේ. වර්තමාන වර්ෂයට අදාල

1. බදු වියදම හා
2. උපචිත බදු කොපමණද?

(1) රු. 160000 ක් හා රු. 20000 කි.
(2) රු. 140000 ක් හා රු. 20000 කි.
(3) රු. 160000 ක් හා රු. 110000 කි.
(4) රු. 160000 ක් හා රු. 55000 කි.
(5) රු. 140000 ක් හා රු. 105000 කි.

(..........)

12. රු. 1500 000කට අත්පත් කරගෙන තිබූ සහ 2014.03.31 දින පළමු වන වතාවට ප්‍රත්‍යාගණනය කර තිබූ ඉඩමක් 2015.03.31 දින නැවත ප්‍රත්‍යාගණනය කරන ලදී. දෙවනි ප්‍රකාශනය නිසා ඉඩමේ ධාරණ වටිනාකම රු. 1800 000 ක් වූ අතර දෙවෙනි ප්‍රත්‍යාගණනයෙන් ජනනය වූ අතිරික්තය රු. 600 000 කි.

(අ) ප්‍රථම වතාවට මෙම ඉඩම ප්‍රත්‍යාගණනය කළ අගය හා
(ආ) දෙවෙනි ප්‍රත්‍යාගණනයෙන් පසු 2015.03.31 දිනට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය පිළිවෙලින් දක්වෙන්නේ,

(1) රු. 1800000 හා රු. 300000
(2) රු. 1800000 හා රු. 600000
(3) රු. 1200000 හා රු. 600000
(4) රු. 1200000 හා රු. 300000
(5) රු. 1500000 හා රු. 300000

(..........)

13. රත්නරා සමාගමේ 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

	රු. 000'	
	හර	බැර
සේවක වේතන (දළව)	6440	
අර්ථසාධක අරමුදල් වියදම්	210	

සමාගමේ සේවකයන් සියළු දෙනාම සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වන අතර සමාගම 12% ක් ද සේවකයින් 8% ක් ද වශයෙන් ඒ සඳහා දායක වේ.

1. සමාගමේ අර්ථසාධක අරමුදල් වියදම හා
2. ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ගිණුමේ ශේෂය පිළිවෙලින් දක්වෙන්නේ,

(1) රු. 210000 හා රු. 840000 කි. (2) රු. 1400000 හා රු. 560000 කි.
(3) රු. 840000 හා රු. 1190000 කි. (4) රු. 6440000 හා රු. 210000 කි.
(5) ඉහත කිසිවක් නොවේ. (..........)

14. 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා රු. 250000 ක ලාභයක් ලැබූ ව්‍යාපාරයකට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත.
මෙම ව්‍යාපාරය 2014.04.01 දින ආරම්භ කරන ලදී.

	රු. 000'
වර්ෂය තුළ මුළු වත්කම්වල වැඩිවීම	4 500
ගැනිලි	1 000
අතිරේක ප්‍රාග්ධනය යෙදීම	500

2015.03.31 න් අවසන් වර්ෂයේ වගකීම්වල වැඩිවීම / අඩුවීම කොපමණද?

(1) රු. 2450 000 ක වැඩිවීමකි. (2) රු. 3250 000 ක වැඩිවීමකි.
(3) රු. 1750 000 ක වැඩිවීමකි. (4) රු. 2450 000 ක අඩුවීමකි.
(5) රු. 4750 000 ක වැඩිවීමකි. (..........)

15. ක්‍රීඩා සමාජයකට අදාලව 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබාදී ඇත.

	රු.
2014.04.01 හිඟ හිටි සාමාජික මුදල්	2000
2014.04.01 කලින් ලද සාමාජික මුදල්	1000
මුදලින් ලද සාමාජික මුදල්	80000
කපා හල සාමාජික මුදල්	1000
2015.03.31 හිඟ හිටි සාමාජික මුදල්	2500

වර්ෂය සඳහා පිළියෙල කල ආදායම් හා වියදම් ගිණුම තුළ සාමාජික මුදල් ලෙස රු. 78000 ක් දක්වා ඇත්නම් 2015.03.31 දිනට කලින් ලද සාමාජික මුදල කීයද?

(1) රු. 1500 කි. (2) රු. 4500 කි. (3) රු. 5500 කි.
(4) රු. 6000 කි. (5) රු. 6500 කි. (..........)

16. ජේසන් පොදු සමාගමේ 2014/ජුනි 30 දින ලද බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය රු. 40000 ක් වූ නමුත් එදිනට ව්‍යාපාරයේ බැංකු ගිණුම අනුව බැංකු ශේෂය රු. 60000 ක් විය. පසුව පහත කරුණු අනාවරණය විය.
රු. 18000 ක ණයගැති සෘජු ප්‍රේෂණ හා රු. 5000 ක බැංකු ගාස්තු ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාර්තා වී නොමැත.
2014.06.30 දිනට නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු. 18000 ක් විය.
2014.06.30 දිනට තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකම කීයද?

(1) රු. 18000 කි. (2) රු. 40000 කි. (3) රු. 51000 කි.
(4) රු. 61000 කි. (5) රු. 65000 කි. (..........)

17. තෙළුම් හා මානෙල් විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2014.03.31 දින මිලූ බඳවා ගන්නා ලදී. මිලූ බඳවා ගැනීමේදී හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය අගය කර එය වත්කමක් ලෙස පොත්වල සටහන් නොකොට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් මගින් ගලපන ලදී. මෙම ගැලපීම මගින් තෙළුම් හා මානෙල්ගේ හිමිකම් පිළිවෙලින් රු. 50000 ක් හා රු. 100000 ක් ලෙස වැඩි වූ අතර මිලූ ගේ හිමිකම රු. 150000 කින් පහළ යන ලදී. තෙළුම්, මානෙල් හා මිලූ අතර නව ලාභාලාභ බෙදා ගැනීමේ අනුපාතය 4:3:3 කි.

2014.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ගණනය කරන ලද කීර්තිනාමයේ අගය හා සෙරම් හා මාකෙල් අතර සිදු වූ පැරණි ලාභාලාභ බෙදාගැනීමේ අනුපාතයත් පිළිවෙලින් දක්වෙන්නේ,

	කීර්තිනාමය	ලාභාලාභ අනුපාතය
(1)	රු. 500 000	1:1
(2)	රු. 400 000	3:2
(3)	රු. 550 000	2:3
(4)	රු. 600 000	1:1
(5)	රු. 450 000	3:2

(..........)

18. නිර්මලා සමාගමේ තොග පහත අයිතමවලින් අඩංගුය.

අයිතමය	ප්‍රමාණය	පිරිවැය	විකුණුම් මිල	නිමකිරීමේ පිරිවැය
P	50	200	250	100
Q	150	300	350	25

අයිතම ක්‍රමයට අනුව සමාගමේ තොගයේ අගය වන්නේ,

(1) 55000 (2) 56250 (3) 65000
(4) 52500 (5) 53000 (..........)

19. සමාගමක 2014.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 290000 ක් වූ අතර එය එදිනට පිළියෙල කල ණයගැති ශේෂ ලේඛනයේ එකතුව සමග සමාන නොවීය. ශේෂ අසමාන වීමට බලපෑ හේතු පහත පරිදි විය.

1. රු. 20000 ක ණයට විකුණුම් ණයගැති ලෙජරය තුළ වාර්තා කර නොමැත.
2. ආපසු එවුම් ජනලය එකතු කිරීමේදී රු. 2000 ක් අඩුවෙන් එකතු කර ඇත.
3. රු. 5000 ක බොල්ණය කපා හැරීම පොදු ලෙජරය තුළ වාර්තා කර නොමැත.

2014.03.31 දිනට ණයගැති ශේෂ ලේඛනයේ පැවති එකතුව වන්නේ,

(1) රු. 260000 කි. (2) රු. 270000 කි. (3) රු. 290000 කි.
(4) රු. 263000 කි. (5) රු. 285000 කි. (..........)

20. 2015 ජනවාරි මාසය සඳහා ව්‍යාපාරයක පහත තොරතුරු දක්වේ.

	රු. 000'
අත්පිට ගැනුම්	25000
ගනුදෙනුකරුවන්ගෙන් එකතු කළ මුදල්	80000
ගෙවූ වියදම්	15000
මුදල් ශේෂ - 2014.1.1 දිනට	50000
- 2014.1.31 දිනට	40000
ද්විමාසික භාණ්ඩාගාර බිල්පත්	
2014.1.1 දිනට	100000
2014.1.31 දිනට	නැත.

ජනවාරි මාසය තුළදී මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම හෝ අඩුවීම කුමක්ද?

(1) රු. 10000 ක වැඩිවීමකි. (2) රු. 10000 ක අඩුවීමකි.
(3) රු. 110000 ක වැඩිවීමකි. (4) රු. 110000 ක අඩුවීමකි.
(5) රු. 90000 ක වැඩිවීමකි. (..........)

21. සමාගමක් 2013.03.31 දින පිරිවැය රු. 600000 ක් හා එදිනට සමුච්චිත ක්ෂය රු. 200000 ක් වූ යන්ත්‍රයක්, නව යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් රු. 500000 ක අගයකට පවරන ලදී. නව යන්ත්‍රය වෙනුවෙන් මුදලින් රු. 250000 ක් ද ගෙවන ලදී.
මෙම ගනුදෙනු මගින් සමාගමේ යන්ත්‍රවල ධාරණ අගයට සිදුවූ බලපෑම වන්නේ,

(1) රු. 200000 කින් අඩුවේ. (2) රු. 400000 කින් අඩුවේ.
(3) රු. 250000 කින් වැඩිවේ. (4) රු. 500000 කින් වැඩිවේ.
(5) රු. 350000 කින් වැඩිවේ. (..........)

ADVANCEDLEVELPAPERS SRI LANKA SCIENCEPAPERS.BLOGSPOT

22. ගිණුම්කරණ පරිසරයට අදාල පහත තොරතුරු ඔබට සපයා ඇත.

A- ක්ෂය වෙන් කිරීම
B- මිනිස් ශ්‍රමය වෙනුවට නව යන්ත්‍ර භාවිතය
C- ආකල්ප
D- වෙළඳපොල තත්වය

මේවා ගිණුම්කරණ පරිසරයේ කුමන කොටසකට අයත් වේද?

	A	B	C	D
(1)	තාක්ෂණික	ශිල්පීය හා වෘත්තීය	නීතිමය	සමාජ හා සංස්කෘතික
(2)	ශිල්පීය හා වෘත්තීය	තාක්ෂණික	සමාජ සංස්කෘතික	ආර්ථික හා දේශපාලන
(3)	නීතිමය	ශිල්පීය හා වෘත්තීය	තාක්ෂණික	ආර්ථික හා දේශපාලන
(4)	ශිල්පීය හා වෘත්තීය	නීතිමය	තාක්ෂණික	ආර්ථික හා දේශපාලන
(5)	ශිල්පීය හා වෘත්තීය	ආර්ථික හා දේශපාලන	නීතිමය	තාක්ෂණික

(..........)

23. පහත ප්‍රකාශ ඔබට ලබා දී ඇත.

A- පිරියත හා උපකරණවල අගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්විය යුතුය.
B- අයිතිකරු ව්‍යාපාරයට යෙදවූ ප්‍රාග්ධනය ව්‍යාපාරයේ දෘෂ්ටියෙන් වගකීමක් ලෙස ගිණුම්ගත කළ යුතුය.
C- අඩමාන ණය සඳහා වෙන් කිරීම ගැලපුම් සංකල්පයට අනුකූල වේ.

ඉහත කුමන ප්‍රකාශ සත්‍ය ද?

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) C පමණි. (5) ඉහත සියල්ලම (..........)

24. සමාගමක් පිරිවැය රු. 250000 ක් හා 2014.03.31 දිනට සමුච්චිත ක්ෂය රු. 250000 ක් වූ යන්ත්‍රයක් 2014.03.31 දින රු. 80000 කට විකුණන ලදි. සමාගම විසින් යන්ත්‍ර පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලබයි. යන්ත්‍ර විකිණීමේ ලාභය/ අලාභය වන්නේ,

(1) අලාභය රු. 25000 කි. (2) අලාභය රු. 80000 කි. (3) ලාභය රු. 80000 කි.
(4) ලාභය රු. 50000 කි. (5) ලාභය රු. 67500 කි. (..........)

25. ව්‍යාපාරයකට අදාලව පහත තොරතුරු ඔබට සපයා ඇත.

	2013.04.01	2014.03.31
මුළු වත්කම්	560000	712000
වගකීම්	120000	140000

2014.03.31 න් අවසන් වර්ෂය තුළ අයිතිකරු රු. 40000 ක අමතර ප්‍රාග්ධනයක් යොදා ඇති අතර රු. 120000 ක ගැනිලි කර ඇත. 2014.03.31 න් අවසන් වර්ෂයේ ලාභය / අලාභය වන්නේ,

(1) රු. 52000 ක ලාභයකි. (2) රු. 92000 ක ලාභයකි. (3) රු. 212000 ක ලාභයකි.
(4) රු. 52000 ක අලාභයකි. (5) රු. 92000 ක අලාභයකි. (..........)

26. නෙත්මි ව්‍යාපාරයේ 2014 හා 2015 වර්ෂවලට අදාළ තොරතුරු පහත දක්වේ.

	2015.03.31	2014.03.31
ණයහිමියෝ	65000	40000
තොගය	38000	12000

වර්ෂය තුළදී රු. 160000 ක් ණයහිමියන්ට මුදලින් ගෙවා ඇත. රු. 5000 ක වට්ටමක් ඔවුන්ගෙන් ලැබී ඇත. විකුණුම් මිල තීරණය කරනු ලබන්නේ විකුණුම් පිරිවැයට 20% ක ලාභයක් එකතු කිරීමෙනි. මෙම ව්‍යාපාරයේ 2015.03.31 න් අවසන් වර්ෂයේ විකුණුම් වටිනාකම වන්නේ,

(1) රු. 259200 (2) රු. 131200 (3) රු. 278200
(4) රු. 256800 (5) රු. 196800 (..........)

27. ව්‍යාපාරයක් සතුව පවතින ගොඩනැගිලිවලට අදාළ තොරතුරු පහත දක්වේ.
2014.01.01 දිනට ගොඩනැගිල්ලේ පිරිවැය රු. 700000
එදිනට ක්ෂය වෙන් කිරීම රු. 250000
2014.09.30 දින මෙම ගොඩනැගිල්ල රු. 650000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.
ගොඩනැගිල්ල වාර්ෂිකව 10% ක සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.
ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලය වන්නේ,
(1) රු. 250000 ක ඌනතාවයකි.
(2) රු. 250000 ක අතිරික්තයකි.
(3) රු. 252500 ක ඌනතාවයකි.
(4) රු. 252500 ක අතිරික්තයකි.
(5) රු. 500000 ක ඌනතාවයකි.
(..........)

28. සිහිජය ව්‍යාපාරය තම ලී බඩු නිෂ්පාදය සඳහා යන්ත්‍රයක් විදේශයෙන් ආනයනය කරන ලදී. එයට අදාළ වියදම් පහත දක්වේ.

යන්ත්‍රයේ ගැනුම් මිල නැව් ගාස්තු හා රක්ෂණය	650000
වරායේ සිට ප්‍රවාහන ගාස්තු	50000
සවිකිරීමේ ගාස්තු	30000
භාවිතයට පෙර පළමු අත්හද බැලීමේ වියදම	20000
පළමු නිෂ්පාදනයට පසුව දරූ නඩත්තු වියදම්	40000

මෙම යන්ත්‍ර ශේෂ පත්‍රයේ දක්විය යුතු පිරිවැය වන්නේ,
(1) රු. 750000
(2) රු. 790000
(3) රු. 650000
(4) රු. 740000
(5) රු. 770000
(..........)

29. A, B, C ලාභාලාභ සමානව බෙදා ගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ය. A 2014.3.31 දින හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර එදිනට කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම්වල ගලපන ලදී. හවුල් ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාමට B හා C තීරණය කරන ලදී.

ප්‍රාග්ධන ගිණුම් ශේෂ	B	C
කීර්තිනාමය ගැලපීමට පෙර	200000	150000
කීර්තිනාමය ගැලපීමෙන් පසු	160000	140000

හවුල්කරුවන් විසින් එකඟ වූ කීර්තිනාම වටිනාකම කුමක්ද?
(1) රු. 10000
(2) රු. 25000
(3) රු. 50000
(4) රු. 75000
(5) රු. 150000
(..........)

30. ජනහිත සමාගම විදුලි උපකරණ මිලට ගෙන විකුණන ව්‍යාපාරයකි. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ගැණුම් හා විකුණුම් පිළිබඳ පහත තොරතුරු ඔබට සපයා ඇත.

අත්පිට ගැණුම්	රු. 420000
ණයට ගැණුම්	රු. 564000
අත්පිට විකුණුම්	රු. 800000
ණයට විකුණුම්	රු. 940000
ගෙවූ VAT	රු. 60000

මෙම ගනුදෙනුවලට අදාළව දේශීය ආදායම් බදු 20% ක VAT එකතු කර වටිනාකම් දක්වා ඇත. දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු VAT ප්‍රමාණය කොපමණ ද?
(1) රු. 164000 කි.
(2) රු. 66000 කි.
(3) රු. 348000 කි.
(4) රු. 202000 කි.
(5) රු. 840000 කි.
(..........)

31. මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග හඳුනාගැනීමේ නිර්ණායක 2 කවරේද?
(1) [illegible]
(2) [illegible]

32. මූල්‍ය කල්බද්දක් යටතේ අත්පත් කරගන්නා ලද වත්කම එහි අනුරූපී වගකීම සමඟ හඳුනාගැනීම කුමන ගිණුම්කරණ මූලධර්මයට අනුකූල වේද?
[illegible]

33. සිරිසා ලක්මිණි පොදු සමාගමේ 2015.03.31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 3000000 ක් වූ අතර කොටසක සාමාන්‍ය අගය රු. 20 ක් විය. සෑම සාමාන්‍ය කොටස් 3 කටම 1 බැගින් කොටසකට රු. 15 ක් වූ හිමිකම් නිකුතුවක් කරන ලදී. හිමිකම් නිකුතුවට අදාළ ජ'නල් සටහන සංලක්ෂ්‍ය සමඟ ලියන්න.

මුදල් හර 15000,000

ප්‍රකාශිත ප්‍රාග්ධනය බැර 15000,000

34. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට සම්බන්ධ LKAS 07 ප්‍රමිතයට අනුව ව්‍යාපාරයක මුදල් ප්‍රවාහයන් වර්ග 3 ක් යටතේ ඉදිරිපත් කරයි. ඒවා නම් කරන්න.

මෙහෙයුම් ක්‍රියාකාරකම් මූල්‍ය ක්‍රියාකාරකම්

ආයෝජන ක්‍රියාකාරකම්

35. LKAS 17 කල්බදු ප්‍රමිතයට අනුව මූල්‍ය හා මෙහෙයුම් කල්බදු අතර වෙනස්කම් 2 ක් සඳහන් කරන්න.

මූල්‍ය කල්බදුදී ... වත්කම ව්‍යාපාරයේ වත්කමක් ලෙස දක්වයි.

මූල්‍ය කල්බදුව ... සටහන් ... ඇත

මෙහෙයුම් කල්බදුව ... සටහන් නොකරයි

36. සීමාසහිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම ඇත්තේ කවුරුන් හටද?

සමාගමේ අධ්‍යක්ෂකවරුන්ට

37. පහත තොරතුරු 2015.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ අත්පත් කරගත් වෑන් රථයකට අදාළ වේ.

වෑන් රථයේ අස්ථිර ගැනුම් මිල	රු. 2000000
ගිවිසුම් කාලය අවුරුදු 5	
මූලික තැන්පතුව	රු. 500000
මාසික වාරිකය (පොලිය සහිත)	රු. 75000
කල් බදු පොලිය වාර්ෂිකව	රු. 600000
2014/2015 ගිණුම් වර්ෂයේ ගෙවූ වාරික	රු. 900000

ඉහත තොරතුරු සැලකිල්ලට ගනිමින්,

(1) 2015.03.31 දිනට කල්බදු ණයගිමි ගිණුමේ ශේෂය සොයන්න. රු. 2500,000

(2) මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්විය යුතු ජංගම හා ජංගම නොවන වගකීම් ප්‍රමාණයන් වන්නේ,

ජංගම වගකීම : රු. 300000

ජංගම නොවන වගකීම : රු. 2200000

38. සීමාසහිත තොරංජන් සමාගම රු. 15 සාමාන්‍ය කොටස් 100000 ක් මහජනතාවට නිකුත් කරන ලදී. එහිදී අයදුම්පත් 130000 ක් ලැබුණු අතර වැඩිපුර ලත් අයදුම්පත් හරවා යවා කොටස් විභජනය කරන ලදී. කොටස් නිකුතුවට අදාළ ජ'නල් සටහන් ලියන්න.

මුදල් ගිණුම හර 1500,000

සාමාන්‍ය ප්‍රාග්ධන බැර 1500000

39. ව්‍යාපාරයක කෙටුම්පත් ලාභය 120000 කි. පසුව පහත කරුණු සොයාගන්නා ලදී.

1. රු.15000 ක ණයට විකුණුම් දෛනික විකුණුම් පොතෙහි සටහන් කර නැත.
2. රු. 3700 ක ලද වට්ටම් ණයහිමි ගිණුමෙහි නිවැරදිව සටහන් කර දුන් වට්ටම් ගිණුමට හර කර ඇත.
3. ගෙවන ලද ගෙවල් කුලිය වූ රු. 7000 ක මුදල ගෙවල් කුලී ගිණුමට පිටපත් කර ඇත්තේ 700 ක් ලෙසය.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි ලාභය කොපමණද?

රු. 136100

40. හවුල් ව්‍යාපාරයක සිදුවන පහත ගනුදෙනු හා සිදුවීම් මගින් හවුල් ව්‍යාපාරයේ හිමිකම වැඩිවේද? අඩුවේද? නැතිනම් වෙනස් නොවේද යන්න දක්වන්න.

වැඩිවේ / අඩුවේ / වෙනස් නොවේ.

A. නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේදී ප්‍රාග්ධන ගිණුම මගින් කීර්තිනාමය ගැලපීම — වෙනස් නොවේ

B. හවුල්කරුවන් මුදල් ගැනිලි සිදුකිරීම — අඩු වේ

C. ප්‍රාග්ධන පොලී ලෙස ලාභය විසර්ජනය කිරීම ....

D. හවුල්කරුවෙකු සහ පෞද්ගලික ණයට පොලී ව්‍යාපාරයට ගෙවීම ......ගිණුම් වෙනස් වේ......

..........වියදම..........

41. සමාගමක 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලැබී ඇත.

		රු.
දුන් වට්ටම්		15000
කපාහල බොල් ණය නැවත ලැබීම		8000
බොල් ණය කපා හැරීම		10000
අඩමාන ණය වෙන් කිරීම -	2013.04.01 දිනට	4500
	2014.03.31 දිනට	6000

2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ණයගැතියන් සම්බන්ධ වියදම් වන්නේ කොපමණද?

..........රු. 18500..........

42. මුදල් පොත හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයත් අතර පවත්නා සමානතාවක් හා අසමානතාවක් ලියන්න.

සමානතාවක් ......මුදල් ගනුදෙනු පමණක් ඇතුළත් වේ......

අසමානතාවක් ......[illegible]......

43. LKAS 16 ට අනුකූලව පහත පද නිර්වචනය කරන්න.

(1) වත්කමක ක්ෂය කළ හැකි අගය ......[illegible]......

(2) වත්කමේ සාධාරණ අගය ......[illegible]......

44. හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ගිණුම්ගත කිරීමට සිදුවන අවස්ථා 2 ක් නම් කරන්න.

හවුල් කරුවකු ව්‍යාපාරයට ඇතුළත් කර ගැනීම.

හවුල් කරුවකු විශ්‍රාම යාම.

45. ඒකපුද්ගල ව්‍යාපාරයක ......ප්‍රාග්ධන ගිණුම...... , හවුල් ව්‍යාපාරයක ......ජංගම...... ගිණුම් හා ......ප්‍රාග්ධන...... ගිණුම්වල ශේෂයන්ද , සංස්ථාපිත සමාගමක ......ප්‍රකාශිත ප්‍රාග්ධනය...... හා ......සංචිත...... වල එකතුවෙන්ද ......හිමිකම...... පෙන්වනුයේ.

46. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ ආයතනය විසින් පාලනය කරන, අනාගත ආර්ථික ප්‍රතිලාභයක් ......වත්කම...... ලෙස හැඳින්වේ.

47. ගිණුම් කාලච්ඡේදයක ......ලාභය...... නිශ්චය කිරීමේදී එම ගිණුම් කාලච්ඡේදයට අදාළව හඳුනාගත් ආදායමට එරෙහි වන ......වියදම්...... එම ගිණුම් කාලච්ඡේදය තුළම හඳුනාගත යුතු බව ......ගැලපුම්...... අදහස් වේ.

48. යම් නිශ්චිත දිනකට ව්‍යාපාර ආයතනයක සතු ......වත්කම්...... හා එම ......වත්කම්වලට...... ඇති හිමිකාරත්වය මූල්‍ය තත්ත්වය මගින් පිළිබිඹු කරයි.

49. ව්‍යාපාරයක් දිගින් දිගටම පවත්නා ව්‍යාපාරයක් ලෙස සලකා අනාගතය දැකිය හැකි නිශ්චිත කාලයක් සඳහා ......පවතී...... යැයි උපකල්පනය කරමින් මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු බව ......අඛණ්ඩ පැවැත්ම...... සංකල්පයෙන් අදහස් කෙරේ.

50. ආපසු එවුම් ගිණුම ......ආදායම්...... ගිණුමක් වන අතර ක්ෂය සඳහා වෙන් කිරීමේ ගිණුම ......වත්කම්...... ගිණුමකි.

WWW.LOL.LK
BUY
PAST PAPERS
071 777 4440
Buy Online - www.LOL.lk
• GCE O/L
• GCE A/L
• PAST PAPERS
• SHORT NOTES

Protect Yourself From Coronavirus

YOU STAY AT HOME

WE DELIVER!

ORDER NOW

075 699 9990

WWW.LOL.LK

≡ LOL.lk Learn Ordinary Level

TOP CATEGORIES

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW

ISLANDWIDE DELIVERY
Free delivery on all orders over Rs. 3500

More than 1000+ Papers
For all major Subjects and mediums

ONLINE SUPPORT 24/7
Shopping Hotline 071 777 4440

FEATURED PRODUCTS

SORT BY

- GCE O/L Exam

GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART

GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART

GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART

GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00



GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00

GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00